# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,626—1946ක්වූ නොවැම්බර් මස 8 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—නාගෙ ලිදක් බැඳීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" පස්වෙනි වගන්තියේ සරතිබෙන පංගුර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 2.031. ගම—ඔවකැත්තර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පුවක්වත්ත සහ බෝගස වත්ත | අවුරුදු 50 පොල්ගසක්ද, අවුරුදු 1 රබර් ගසක්ද, අවුරුදු 20 පුවක්ගසක්ද, ලිඳක්ද ඇති ඉඩම | දෙන් මාර්ටින් කුලතුංග, ඔවකැත්තර, කැස්බෑව | 0 0 6·28 |
| 2 | පම්පියකුඹුර | .. අවුරුදු 15 කුඹගස් 2ක් ඇති ඔපිට | .. ඩී. ඇල්. චාර්ලිස් පීරිස්, "ආනන්දගිරි" සුවාරපොල, කැස්බෑව | 0 0 0·25 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හිනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනම් තමුන්ම හෝ හෝත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ නොවැම්බර් මස 4වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඒ. අරුල්පිරගාසම්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මහතා.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කෝට්ටේ-තලංපෙ පාරේ 15වෙනි කණුවේ අහතුරුදායක වංගුවක් ඇඳහැරීමට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" පස්වෙනි වගන්තියේ සරතිබෙන පංගුර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 2,041. ගම—හබරකඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ආච්චිගේවත්ත හොහොත් හබරකඩවත්ත | අවුරුදු 30 පමණ වයස දුනුම්ඩලගසක් ඇති පොල් සහ කුරුඳු ඉඩම | ඇඩා අභයසුන්දර හෝනා මහත්මිය, "මිලා ලුසිලා", ගාල්ල | 0 0 6·2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හිනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනම් තමුන්ම හෝ හෝත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින පෙරවරු 10.30ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ නොවැම්බර් මස 4වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඒ. අරුල්පිරගාසම්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මහතා.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අඹුලුගම සොහොන්භූමියක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සරතිබෙන පංගුර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලය පිට පලාත් පාලක මිඩායක මණ්ඩලයෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,142. ගම—අඹුලුගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හපුවලේවත්ත | .. සොහොන්භූමිය | .. ඇල්. බී. විජේසූරිය, අඹුලුගම | .. 0 1 16·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හිනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනම් තමුන්ම හෝ හෝත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ නොවැම්බර් මස 29වෙනි දින පෙරවරු 10ගේ කාලයටම මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින මහනුවර කච්චේරියේදීය.

එච්. සී. ගුණවර්ධන,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ උප ඒජන්ත මහතා.

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

**දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.**

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස ගාල්ලේ කච්චේරියේදී වර්ෂ 1946ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින පූ. භා. 10ට 1935 අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇත හොත් එය දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාග කළ යුතුය.

ආර්. මුනසිංහ,
අතිරේක ඉඩම් කොමසාරිස්තුමා.

වර්ෂ 1946ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින කොළඹ ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

**දීමට යන ඉඩම්වල විස්තර.**

පලාතේ අංකය F. V. P. 578. ගම—ගෙඹාමුලේ.

| කැබැල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 527 .. | ජේනාගේ පණ්ඩිතරත්න | .. 15 2 25 |
| 529 .. | එම .. | .. 0 2 0 |
| 532 .. | එම .. | .. 5 2 17 |
| 535 .. | එම .. | .. 21 3 35 |

---

## ටෙණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L. W. 5933.

වර්ෂ 1947ක් අවුරුද්දේ ශ්‍රීපාදස්ථානය වන්දනා කාලය පහත සඳහන් රජයන්තක ඉඩම්වල තාවකාලික කඩ සෑදීමේ බලය ඉල්ලා එවන මුදලක් ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. එකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර අඩංගු කවරයේ මතුපිට "ශ්‍රීපාදස්ථානයට යන පාරේ කඩ සෑදීමට ඉල්ලුම්පත්‍රයකි" කියා ලියා තිබිය යුතුයි. මේ ඉල්ලුම්පත්‍ර ඒජන්ත උන්නාන්සේ විසින් 1946ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින පෙරවරු 10 වනතුරු භාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර යයි ඒවා බවට ඔප්පුකරන්ට ඕනෑය.

3. භාරගන්ට යෙදුන ඉල්ලුම්පත්‍රවල මුදල් එවලේම ගෙවන්ට ඕනෑය. තවද ඒ සඳහා උම්මිනාකරණ ඔප්පු අවසරපත්‍රයද ලබාගත යුතුයි.

4. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාර නොගැනීමද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද, බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

5. යම් අන්දමකින් ඉල්ලුම්පත්‍ර පිළිගැනීමට නුසුදුසුවන් ඒවා උනිනම්, කඩකීම වෙන්දේසියේ විකිනීමටත්, එකී වෙන්දේසියේදී යම් ලංසු ආදියක් නොපිළිගැනීමටත්, ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

6. බදුකාරයා විසින් කඩවල ඇති සියලුම කෑම් වර්ග මැස්සන්ගෙන් ප්‍රවේසම්වෙන අන්දමට තැබියයුතු සම්පාදක යෙදිය යුතුයි. මේ අන්දමට පිළිනොපැද්දහොත් බද්ද අවලංගුකරනු ලැබේ.

7. බදුකාරයා විසින් සනීපාරක්ෂක දෙපාර්තමේන්තුවේ මහතුන්ගේ අනපනත්වලට එකඟව අඩු වශයෙන් එක කඩයට එක කොන්ක්‍රීට් ටැංකියකින් යුත් වැසිකිළියක් සෑදිය යුතුය. මේ සඳහා රුපියල් 10ක ඇපයක් මුදලින් තැබිය යුතුය. වර්ෂ 1947ක් මාර්තු මස 1වෙනි දිනට ප්‍රථම වැසිකිළි සෑදුවහොත් ඇප මුදල ආපසු ගෙවනු ලැබේ. නැතහොත් එම මුදලෙන් ආණ්ඩුව විසින් වැසිකිළි සාදවනු ලැබේ.

8. 1947ක් ජූනි මස 1වෙනිදසින් ප්‍රථම සියලුම කඩ අස්කර ගන්ට ඕනෑය.

(1) නිලිහෙලේ කඩ 2යි. (එකක් පාරට යටිපැත්තේ අනික අම්බලමට යාව.)
(2) හැරම්විටිපානේ කඩ 1යි.
(3) ගැටනෑවුල්ලේ කඩ 1යි.
(4) ඉදිකටුපාහේ ගල්පොත්තේ කඩ 1යි.
(5) මැල්ලවලකඳුරේ කඩ 1යි.
(6) පමහැල්ලේ කඩ 1යි.
(7) එරත්නේ තුම්මෝදර කඩ 2යි. (එකක් තුම්මෝදර අනික ගඟෙන් එගොඩ.)
(8) ධම්රාජගලේ කඩ 1යි.
(9) මැදහින්නේ කඩ 1යි.
(10) සීතගඟුලේ කඩ 1යි.
(11) එරත්න පාරේ බෙරුමත්ඩියේ ගල්ලෑල්ල අසල කඩ 1යි.
(12) හැටහැවුල්ලේ ඉස්ටේෂන් කොබ්බෑගාව ආණ්ඩුවේ ඉඩමේ කඩ 1යි.
(13) හැරම්විටිපානේ සහ මැල්ලවලකඳුර අතර ගෝනගැන්නේ හෙල්ලේකැන්නේ කඩ 1යි.
(14) මස්කෙලියේ ගඟ ලඟ ප්ලෑන් නො. 5, V. P. 436ගේ කඩ 1යි.
(15) හැටන් පාරේ ඉදිකටුපාගේ කඩ 1යි.
(16) එරත්න පාරේ ඉදිකටුපාගේ කඩ 1යි.
(17) ඉහල පමනැල්ල සහ නිලිහෙල අතර ශ්‍රීපාදේ පාර සහ බුලත්වැල්දෙණිව සිව එහා පාර එකතුවන තැන ආණ්ඩුවේ ඉඩමේ කඩ 1යි.
(18) කලගහලන්දේ ශේක්ෂණ, ප්ලෑන් නො. 22B, නො. 326 දරණ සිතියමේ කඩ 1යි.
(19) ආඩියාමලතැන්න කඩ 1යි.
(20) ගුරුගල්හෙල ඉස්ටේෂම කඩ 1යි.
(21) දෙමලමලතිස්ස තැන්න කඩ 1යි.
(22) දියබෙත්මේ හෝසගේ අම්බලම ලඟ කඩ 1යි.

ඕ. මතුපුෂ්ප,
සබරගමු පලාතේ මහා ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1946ක්වූ නොවැම්බර් මස 1වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය.

---

## දිස්ත්‍රික් රෝඩ් කොමිටි පිළිබඳ දැන්වීම.

වර්ෂ 1947, 1948 සහ 1949ට නුවරකලාවිය දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ සාමාජිකයින් වශයෙන් තෝරාගැනීමට ඉල්ලුම්කාරයින් හැටියට ඉදිරිපත්වීමට කැමති අයින් සිටිත් නම් තෝරාගැනීමට දිනයට අඩු ගණනේ දවස් දහයකට පෙර එසේ බැඳෙන්ට අදහස්කරන බව ඒ බව දන්වා අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමන් වෙත ලියමිලිවලින් දැනුම්දියයුතු බව ලංකාණ්ඩුවේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි නො. 148වෙනි පරිච්ඡේදයෙහි 23වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

2. ඉහත කී පරිච්ඡේදයෙහි 24වෙනි වගන්තියේ ප්‍රකාර වර්ෂ 1946ක්වූ නොවැම්බර් මස 18වෙනි දින පෙරවරු 10ට අනුරාධපුර කච්චේරියේදී නුවරකලාවිය රෝඩ් කොමිටියට සාමාජිකයින් තුන්දෙනෙක් තෝරාගනු ලැබේ.

ආර්. ඇෆ්. අමරසිංහ,
උ. මැ. ප. ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා.

වර්ෂ 1946ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේදීය.

---

වර්ෂ 1947, 1948 සහ 1949ට තමන්කඩුව පලාතේ දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ සාමාජිකයින් වශයෙන් තෝරාගැනීමට ඉල්ලුම්කාරයින් හැටියට ඉදිරිපත්වීමට කැමති අයින් සිටිත් නම් තෝරාගැනීමට දිනයට අඩු ගණනේ දවස් 10කට පෙර එසේ බැඳෙන්ට අදහස්කරන බව ඒ බව දන්වා අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමාට වෙත ලියමිලිවලින් දැනුම්දියයුතු බව ලංකාණ්ඩුවේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි නො. 148වෙනි පරිච්ඡේදයෙහි 23වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

2. ඉහත කී පරිච්ඡේදයෙහි 24වෙනි වගන්තියේ ප්‍රකාර වර්ෂ 1946ක්වූ නොවැම්බර් මස 22වෙනි දින පෙරවරු 10ට පොළොන්නරුවේ ගම්සභා උසාවියේදී තමන්කඩුව පලාතේ රෝඩ් කොමිටියට සාමාජිකයින් තුන්දෙනෙක් තෝරාගනු ලැබේ.

ආර්. ඇෆ්. අමරසිංහ,
උ. මැ. ප. ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා.

වර්ෂ 1946ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින අනුරාධපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.